සැ. යු.-2010.05..07 වැනි දින පළ වූ අංක 1,653 දරන ගැසට් පත්‍රයේ I-III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,654 - 2010 මැයි මස 14 වැනි සිකුරාදා - 2010.05.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | — | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 703 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලු ම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 මැයි මස 21 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 මැයි මස 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

“1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත”

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය:-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම.
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සංශෝධනයයි

**රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය**

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

රෙජිස්ට්‍රාර් සේවයේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ තරග විභාගය - 2009

ඉහත කරුණ සම්බන්ධයෙන් 2010.01.01 දිනැති අංක 1635 දරන *ගැසට් පත්‍රයෙහි* ඉංග්‍රීසි භාෂාවෙන් පළකල දැන්වීමෙහි අංක 14 - II කොටසේ විෂයයන් හා විෂය නිර්දේශය යටතේ, විෂය අංක 2, Intelligence යන්න Aptitude ලෙස ද, දෙමළ භාෂාවෙන් පලකල දැන්වීමෙ හි අංක 14 -II කොටසේ විෂයයන් හා විෂය නිර්දේශය යටතේ, විෂය අංක (I) යටතේ *மொழியும் ஆற்றலும் (சிங்களம்/தமிழ்)* යන්න *மொழியும் கட்டுரையும் (சிங்களம்/தமிழ்)* ලෙස සංශෝධනය විය යුතුය.

රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

05-302

---

**පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ පර්යේෂණ නිලධාරි හා සත්ත්ව පාලන නිලධාරි තනතුරු පුරප්පාඩු වලට නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත/සීමිත තරග විභාගය - 2010

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ පර්යේෂණ නිලධාරි හා සත්ත්ව නිලධාරි තනතුරු වල 2010.06.30 වැනි දිනට පවතින පුරප්පාඩුවලට පත් කිරීමට සුදුසුස්සන් තෝරා ගැනීම සඳහා අදාළ සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුව A- 4 ප්‍රමාණයේ කඩදාසියේ ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 07 තෙක් පළමුවන පිටුවට ද ඉතිරිය දෙවන පිටුවට ද වනසේ දෙපැත්ත ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කර ගත් අයදුම්පත් 2010.05.31 දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙල කර ගත හැකි වුව ද එය නිවරුදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාග අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්න. තව ද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යය තුනෙන් ම කොළඹ දී පවත්වනු ලබයි. ඔබ විභාගයට පෙනී සිටීමට කැමති භාෂා මාධ්‍යය අයදුම්පත්‍රයේ අදාළ ස්ථානයේ සඳහන් කරන්න.

සටහන් :

(i) පර්යේෂණ නිලධාරි තනතුරට පත් කරනු ලබන්නේ විවෘත තරඟ විභාගය මගින් පමණි. සත්ත්ව පාලන නිලධාරි තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාවෙන් 50% ක් විවෘත තරඟ විභාගය මගින් ද ඉතිරි 50% සීමිත තරඟ විභාගය මගින් ද බඳවා ගැනීම සිදු කෙරේ. සත්ත්ව පාලන නිලධාරි තනතුරුවලට සීමිත බඳවා ගැනීම් තුළින් පත් කිරීම සඳහා වෙන් කර ඇති 50% ප්‍රතිශතයට සරිලන සංඛ්‍යාවක් එසේ පත් කර ගැනීමට නොහැකි අවස්ථාවල දී ඉතිරිවන පුරප්පාඩු සංඛ්‍යාව ද විවෘත බඳවා ගැනීම් තුළින් පුරවනු ලැබේ.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ සම්බන්ධ ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩුව අයදුම්කරුවන් විසින් ම දරා ගත යුතු අතර, ඉල්ලුම්පත්‍රය බහා එවන කවරයේ වමත්පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ පර්යේෂණ නිලධාරි/සත්ත්ව පාලන නිලධාරි තනතුර" යනුවෙන් සඳහන් කළ යුතුය. (තමා අයදුම් කරන තනතුර පමණක් සටහන් කළ යුතුය)

(iii) මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(iv) සත්ත්ව පාලන නිලධාරි තනතුරු සඳහා බඳවා ගනු ලබන්නේ පත්වීමේ දින සිට අවුරුදු 5 ක කාලයක් උතුරු හා නැගෙනහිර පළාත්වල සේවය කළ යුතුය.

02. සේවයේ නියුක්ත කරවීමේ නියමයන් හා සේවා කොන්දේසි :

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තේරී පත්වන අයදුම්කරුවන් වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

ii. තෝරා ගනු ලබන අයදුම්කරුවන් ඔවුන් විසින් අයදුම් කරනු ලබන ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවේ උපලේඛනගත තනතුරක් පිරවීම සඳහා පත් කරනු ලැබේ.

iii. සෙසු සේවා නියුක්ත නියමයන් හා සේවා කොන්දේසි 1980.10.31 දින දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ හා වරින්වර නිකුත් කරන ලද සංශෝධන නියමයන් ; සහ

ලංකාණ්ඩුවේ ආයතන සංග්‍රහයේ විධිවිධාන, අංක 1589/30 හා 2009.02.20 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා රීති හා වරින්වර නිකුත් කරනු ලබන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල නියමයන් පරිදි වේ.

03. *වැටුප් ක්‍රමය*:-ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ තනතුරු සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව SL-1-2006 වැටුප් පරිමාණයේ (රු.22,935 - 10 x 645 - 8 x 790 - 17 x 1,050 - 53,555 වැටුප් පරිමාණයේ) පියවර 1 සිට II දක්වා හිමිවන අතර, එම චක්‍රලේඛයේ විධිවිධාන අනුව වැටුප් ගෙවනු ලැබේ. මෙම වැටුප් ක්‍රමයේ 4 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය ද 7 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ද සමත් විය යුතුය.

04. බඳවා ගැනීම සඳහා පොදු සුදුසුකම් :

i. (අ) සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 20 ට නොඅඩු විය යුතු අතර උපරිම වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.
(ඇ) පශ්චාත් උපාධි සුදුසුකම් සහිත අපේක්ෂකයින් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව අවුරුදු 40 ක් වනු ඇත.
(ඈ) මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු අතර, මනා ශරීර සෞඛ්‍ය තත්ත්වය වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මගින් සනාථ විය යුතුය.
(ඉ) සීමිත බඳවා ගැනීම් සඳහා අයදුම්කරන නිලධාරීන්ට වයස් සීමාව අදාළ නොවේ

05. විවෘත තරඟ විභාගය යටතේ බඳවා ගැනීමේ සුදුසුකම්

(i) පර්යේෂණ නිලධාරීන්
පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් පශු වෛද්‍ය විද්‍යාව/සත්ත්ව පාලන විද්‍යාව/කෘෂිකර්මය පිළිබඳ සිව් අවුරුදු පළමු පෙළ හෝ දෙවන පෙළ ඉහළ පන්තියේ උපාධියක් නැතහොත් සාමාන්‍ය පන්තියේ උපාධියක් සමග එම විෂය ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධියක්

(ii) සත්ත්ව පාලන නිලධාරීන්
පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් පශු වෛද්‍ය විද්‍යාව/සත්ත්ව පාලන විද්‍යාව/කෘෂිකර්මය පිළිබඳ සිව් අවුරුදු උපාධියක්

සටහන :

i. විවෘත බඳවා ගැනීම් සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාගයට අයදුම්පත් භාර ගන්නා අවසන් දින හෝ ඊට පෙර මූලික අධ්‍යාපන සුදුසුකම් ලෙසට නියම කර ඇති උපාධිය සම්බන්ධයෙන් වූ පූර්ණ සුදුසුකම් ලබාගෙන තිබිය යුතුය. මේ සඳහා උපාධි සහතිකයේ වලංගු වන දිනය ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය හෝ ඊට පෙර දිනයක් විය යුතුය.

ii. ප්‍රතිඵල අපේක්ෂාවෙන් ඉදිරිපත් කරන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. විවෘත තරඟ විභාගය යටතේ බඳවා ගැනීමේ ක්‍රමය :

(අ) පර්යේෂණ නිලධාරි හා සත්ත්ව පාලන නිලධාරි තනතුරු සඳහා ඉල්ලුම් කරන අපේක්ෂකයින් ඇමුණුම් 1 හි සඳහන් විෂය නිර්දේශය අනුව විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය." "පර්යේෂණ නිලධාරි" සහ "සත්ත්ව පාලන නිලධාරි" යන තනතුරු දෙකටම ඉල්ලුම් කරන්නේ නම් විභාග ගාස්තුව වශයෙන් රු. 350 ක මුදලක් ද, එක් තනතුරක් සඳහා පමණක් ඉල්ලුම් කරන්නේනම් විභාග ගාස්තු වශයෙන් රු. 300 ක මුදලක් ද, පේරාදෙණිය තැපැල් කාර්යාලයෙන් මාරු කර ගත හැකි වන පරිදි, ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමින් මුදල් ඇණවුමක් ලබා ගෙන අයදුම්පතේ අදාළ ස්ථානයේ අමුණා එවිය යුතුය.

(ආ) එක් අයදුම්කරුවෙකුට අදාළ සුදුසුකම් තිබේනම්, පර්යේෂණ නිලධාරි හා සත්ත්ව පාලන නිලධාරි යන තනතුරු දෙක සඳහා ම එක් ඉල්ලුම්පත්‍රයක් මගින් අයැදුම්කළ හැක.

(ඇ) පොදු ප්‍රශ්න පත්‍රයට හා විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රයට ලබා ගන්නා ලද ලකුණු සංඛ්‍යාවේ එකතුවෙහි අනුපිළිවෙල හා වෙන් කර ඇති පුරප්පාඩු සංඛ්‍යාව පදනම් කර ගනිමින් සම්මුඛ පරීක්ෂණයකට කැඳවා අදළා බඳවා ගැනීම් සිදු කරනු ඇත. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමක් සිදු නොකෙරේ.

ඉහත සඳහන් තනතුරු සඳහා ඉල්ලුම් කරන සියලුම අපේක්ෂකයින් පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත ප්‍රශ්නපත්‍ර සඳහා පෙනී සිටිය යුතුය. එහි සංයුතිය පහත පරිදි කොටස් දෙකකින් යුක්ත වේ.

(අ) *පොදු ප්‍රශ්න පත්‍රය.-* පළමුවැනි කොටස - විෂය අංක 01 - බුද්ධි පරීක්ෂණය (කාලය පැය 01 යි- ලකුණු 100 යි)
අපේක්ෂකයින්ගේ තාර්කික හා විශ්ලේෂණාත්මක හැකියාව මැන බැලීම සඳහා වූ බහුවරණ ප්‍රශ්න පත්‍රයකි
*පොදු ප්‍රශ්න පත්‍රය.-* දෙවැනි කොටස- විෂය අංක 02 - සාමාන්‍ය දැනීම (කාලය පැය 1 1/2 යි- ලකුණු 100 යි)
ශ්‍රී ලංකාවේ දේශපාලනික, සමාජීය, සංස්කෘතික හා ආර්ථික පරිසරය පිළිබඳ මෙන්ම දේශීය හා විදේශීය වර්තමාන සිදුවීම් හා විද්‍යාත්මක හා තාක්ෂණික සංවර්ධනයන් පිළිබඳ දැනුම පරීක්ෂා කරන ව්‍යුහගත ආකාරයේ ප්‍රශ්න පත්‍රයකි.

(ආ) ඉහත තනතුරුවලට ඉල්ලුම් කරන අපේක්ෂකයින් ඉහත සඳහන් පොදු ප්‍රශ්න පත්‍රයට අමතරව තමන් ඉල්ලුම් කරන තනතුර හෝ තනතුරුවලට අදාළ ක්ෂේත්‍රයේ/ක්ෂේත්‍රයන්ගෙන් දැනුම හා හැකියාව පරීක්ෂා කිරීමේ අරමුණින් සකස් කර ඇති විෂයානුබද්ධ ප්‍රශ්නපත්‍රය/පත්‍ර සඳහා පෙනී සිටිය යුතුය. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා කාලය පැය 1 1/2 යි. ලකුණු 200 යි.

07. සීමිත තරග විභාගය යටතේ බඳවා ගැනීම :

සත්ත්ව පාලන නිලධාරි පුරප්පාඩු සංඛ්‍යාවෙන් 50% ක් සඳහා සීමිත තරග විභාගය යටතේ බඳවා ගැනීම් කරනු ලැබේ.

07.1 සීමිත තරග විභාගය යටතේ බඳවා ගැනීමේ සුදුසුකම්

සත්ත්ව පාලනය/කෘෂිකර්මය පිළිබඳ දෑවුරුදු ඩිප්ලෝමාවක් සහිත සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දැනට සේවයේ නියුතු පශු සම්පත් සංවර්ධන නිලධාරියෙකු/පර්යේෂණ සහකාරවරයෙකු හෝ පළාත් සභා සේවයේ නියුතු සත්ත්ව සංවර්ධන උපදේශකවරයෙකු වීම සහ ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන නිලධාරි සේවයේ හෝ පළාත් සභා සේවයේ නියුතු සත්ත්ව සංවර්ධන උපදේශකවරයෙකු වශයෙන් හෝ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ පන්තියේ හෝ I වැනි පන්තියේ වසර 04 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු වීම

හෝ ;

පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් සත්ත්ව පාලන විද්‍යා හෝ කෘෂිකර්මය පිළිබඳ සිව් අවුරුදු උපාධියක් සහිත වසර 05 ක සේවා කාලයක් ඇති සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පශු සම්පත් සංවර්ධන නිලධාරි/පර්යේෂණ සහකාර/පළාත් සභා සේවයේ නියුතු සත්ත්ව සංවර්ධන උපදේශකවරයෙකු වීම

සටහන :

එතෙකුදු වුවත් පහත සුදුසුකම් සහිත නිලධාරීන්ට ද සත්ත්ව පාලන නිලධාරි තනතුර සඳහා සීමිත බඳවා ගැනීම් ක්‍රමය යටතේ අයදුම් කිරීමට හැකියාව ඇත.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දෑවුරුදු රසායනාගාර සහතික පත්‍රය සහිත ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I වන පන්තියේ හා /හෝ විශේෂ පන්තියේ වසර 4 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු පර්යේෂණ සහකාරවරයෙකු වීම.

07.2 සීමිත තරග විභාගය යටතේ බඳවා ගැනීමේ ක්‍රමය :

(අ) ඉහත අංක 6 හි සඳහන් පොදු ප්‍රශ්න පත්‍රයට හා සත්ත්ව පාලන නිලධාරීන් සඳහා වූ විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රයට අයදුම්කරුවන් පිළිතුරු සැපයිය යුතුය.

(ආ) පොදු ප්‍රශ්න පත්‍රයට හා විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රයට ලබා ගන්නා ලද මුළු ලකුණු සංඛ්‍යාවේ අනුපිළිවෙල හා වෙන් කර ඇති පුරප්පාඩු සංඛ්‍යාව පදනම් කර ගනිමින් සම්මුඛ පරීක්ෂණයකට කැඳවා අදාළ බඳවා ගැනීම් සිදු කරනු ඇත. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු දීමක් සිදු නොකෙරේ.

සටහන : සීමිත තරග විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් විවෘත තරග විභාගයට ද පෙනී සිටීමට සුදුසුකම් සපුරා ඇත්නම් තනතුරු සඳහා ඉල්ලුම් කරන ආකාරය අයදුම්පත්‍රයේ නිවරුදිව සටහන් කර එක් අයදුම්පත්‍රයක් මගින් විවෘත හා සීමිත තරග විභාගවලට අයදුම් කළ හැක.

08. සම්මුඛ පරීක්ෂණය සඳහා දැනුම්දුන් විට පහත සඳහන් ලියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

i. උප්පැන්න සහතිකය
ii. උපාධිය හා/හෝ උසස්ම අධ්‍යාපන සහතිකය
iii. මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක්

මින් එකක් පාඨමාලා පිළිබඳ අධ්‍යක්ෂගෙන්, විශ්ව විද්‍යාලීය මහාචාර්යවරයාගෙන්, හෝ ආචාර්යවරයාගෙන් විය යුතුය. (දැනටමත් මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටින්නන් සඳහා මෙම සහතිකය ලබා ගැනීම අවශ්‍ය නොවේ.)

iv. සිංහල/දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් සමත් වූ උසස්ම විභාගවල සහතික

09. වෙනත් විධිවිධාන

i. මෙම ගැසට් නිවේදනයේ විධිවිධාන පනවා නොමැති කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වනු ඇත.

ii. පුරප්පාඩු පිරවීම නොපිරවීම හෝ කොටසක් පමණක් පිරවීම පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ

iii. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

iv. අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු වනු ඇත.

v. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් යටපත් කර ඇති නම් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

vi. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපතද, ලියාපදිංචි කළ කුවිතාන්සියද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලුම් ලිපියද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

vii. අපේක්ෂකයන් විසින් තම අනන්‍යතාව විභාග ශාලාධිපති වෙත තහවුරු කළ යුතු අතර ඒ සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය පමණි

viii. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

ix. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වේ.

__________.
සුනිමල් සේනාරත්න,
ලේකම්,
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය.

2010 අප්‍රේල් මස 07 වැනි දින,
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 45, ශාන්ත මයිකල් පාර,
කොළඹ 03.

ආදර්ශ අයදුම්පත

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ පර්යේෂණ නිලධාරි/සත්ත්ව පාලන නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත/සීමිත තරග විභාගය සඳහා අයදුම්පත

Application for the Open/Limited recruitment of officers in the Post of Research Officer/Livestock Officer in Class II grade II in the Sri Lanka Animal Production and Health Service

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

ලිඛිත විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යය

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

තනතුරු සඳහා ඉල්ලුම් කරන ආකාරය

| | |
|---|---|
| පර්යේෂණ නිලධාරි (විවෘත) | - 1 |
| සත්ත්ව පාලන නිලධාරි (විවෘත ) | - 2 |
| සත්ත්ව පාලන නිලධාරි (සීමිත) | - 3 |
| ඉහත 1 හා 2 තනතුරුවලට | - 4 |
| ඉහත 2 හා 3 තනතුරුවලට | - 5 |
| ඉහත 1 හා 3 තනතුරුවලට | - 6 |
| ඉහත 1, 2 හා 3 තනතුරුවලට | - 7 |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. (i) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම
සිංහලෙන් :————.
ඉංග්‍රීසියෙන් (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) උදා : SILVA K. C.

(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

02. ජාතික හැඳුනුම්පත් අංකය :

03. තැපැල් ලිපිනය :————.
(ලිපිනයෙහි යම් වෙනසක් සිදු වුවහොත්, වහාම ඒ බව දැනුම් දිය යුතුය)

04. ස්ථිර පදිංචි ස්ථානය අයත්
(i) පළාත් සභාව :————.
(ii) දිස්ත්‍රික්කය :————.

05. උපන්දිනය : වර්ෂය මාසය දිනය

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු මාස දින

06. (අ) ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද යන බව :————.

(ආ) ජාතිය (සිංහල/ශ්‍රී ලංකා දෙමළ/ඉන්දියානු දෙමළ/මුස්ලිම්/වෙනත්) :————.

07. (අ) ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

(ආ) විවාහක/අවිවාහක/වැන්දඹු ද යන වග :
අවිවාහක - 1
විවාහක - 2
වැන්දඹු - 3
(අදාල අංකය කොටුව තුළ ලියන්න)

08. අධ්‍යාපන සුදුසුකම් :

| සමත් වූ උපාධිය/පශ්චාත් උපාධි සුදුසුකම | පන්තිය | විශ්ව විද්‍යාලය | වර්ෂය |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |

09. නිවේදනයේ 7 වැනි ඡේදය යටතේ සුදුසුකම් ලබන නිලධාරීන් විසින් පමණක් සම්පූර්ණ කිරීම සඳහා පමණි.
කෘෂිකර්මය/සත්ත්ව පාලනය පිළිබඳ ඩිප්ලෝමාවට අදාළ විස්තර :————.

10. සේවා විස්තර

| දැනට දරන තනතුර | සේවා කාලය | | සේවා ස්ථානය | දෙපාර්තමේන්තුව/පළාත් සභාව |
|---|---|---|---|---|
| | සිට | දක්වා | | |
| | | | | |

11. ඔබ තනතුරු එකකට වඩා අයදුම් කරන්නේ නම් තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු ඔබේ මනාප අනුපිළිවෙල දක්වන්න

i.
ii.

12. මෙම ඉල්ලුම්පත්‍රයෙහි මවිසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු සත්‍යවූත් නිවැරදි වූත්, ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරැදි ඒවා බව හෝ මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට යටත්වන බවත්, පත්කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මා කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත්වන බවත් මම දැන සිටිමි. මම කිසිදු උසාවියකින් සාපරාධී වරදකට වැරදිකරුවෙකු වී නොමැති බවද මගේ සුපුරුදු අත්සන තබා මින් සහතික කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බවද ප්‍රකාශ කරමි.

සටහන :

පහත විස්තර සඳහන් මුදල් ඇණවුම මෙම අයදුම්පත්‍රයට අමුණා ඇත. (ගලවා ගත හැකි පරිදි අමුණන්න)
මුදල් ඇණවුම් අංකය :————.
දිනය :————.
තැපැල් කාර්යාලය :————.

දිනය :————.

————.
අයදුම්කරුගේ අත්සන

I. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

ඉහත අයදුම්කරුවූ ................................... මහතා/මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/.......................... පළාත් සභාවේ .......................... තනතුරක් දරන නිලධාරිවරයෙකු බවත් ඉල්ලුම්පත්‍රයේ සඳහන් තොරතුරු ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොණුව අනුව නිවැරදි බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා මෙම නිලධාරියා තේරී පත්වුවහොත් ඔහු/ඇය මෙම දෙපාර්තමේන්තුවෙන්/පළාත් රාජ්‍ය සේවයෙන් මුදා හැරීමට හැකි/නොහැකි බවත් දන්වමි.

(අදාළ නොවන වචන කපා හරින්න)

————.
දෙපාර්තමේන්තු ප්‍රධානියා
(නිල මුද්‍රාව)

දිනය :————.

ලිපිනය :————.

ඇමුණුම 1

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ පර්යේෂණ නිලධාරි/සත්ත්ව පාලන නිලධාරි තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත/සීමිත තරඟ විභාගයේ විෂය නිර්දේශය

පොදු ප්‍රශ්න පත්‍රය - 1 වැනි කොටස - විෂය අංකය 01 - බුද්ධි පරීක්ෂණය
අපේක්ෂකයන්ගේ තාර්කික හා විශ්ලේෂණාත්මක හැකියාව මැන බැලීම සඳහා වූ බහුවරණ ප්‍රශ්න පත්‍රයකි.

කාලය පැය 1 යි ; ලකුණු 100 යි.

II වැනි කොටස - විෂය අංක 02 - සාමාන්‍ය දැනීම

ශ්‍රීලංකාවේ දේශපාලනික, සමාජීය, සංස්කෘතික හා ආර්ථික පරිසරය පිළිබඳ මෙන්ම දේශීය හා විදේශීය වර්තමාන සිදුවීම් හා විද්‍යාත්මක හා තාක්ෂණික සංවර්ධනයන් පිළිබඳ දැනුම පරීක්ෂා කරන ව්‍යුහගත ආකාරයේ ප්‍රශ්න පත්‍රයකි.
කාලය පැය 1 1/2 යි ; ලකුණු 100 යි.

විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය

පහත සඳහන් විෂය නිර්දේශය අනුව සැකසුණු ප්‍රශ්න පත්‍රයකි.

කාලය පැය 1 1/2 යි ; ලකුණු 200 යි.

(i.) පර්යේෂණ නිලධාරි තනතුර සඳහා වූ විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රයේ විෂය නිර්දේශය (විෂය අංක 03)

01. කෘෂිකර්මය හා සත්ත්ව පාලනය පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තීන්
02. ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප කෘෂිකාර්මික හා සත්ත්ව පාලනය කෙරෙහි කරන බලපෑම
03. සත්ත්ව පාලන ක්ෂේත්‍රයේ ව්‍යුහය, පශු සම්පත් කර්මාන්තයේ වර්තමාන තත්ත්වය
04. භෝග - සත්ත්ව ඒකාබද්ධ සැලසුම්
05. පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළ වැදගත් පර්යේෂණ තොරතුරු
06. පර්යේෂණ තොරතුරු සංනිවේදන ක්‍රම
07. සත්ත්ව පාලනය හා ආශ්‍රිත ක්‍රියාකාරකම්වල ආර්ථික ලාභාලාභ
08. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්තීන්

(ii.) සත්ත්ව පාලන නිලධාරි තනතුර සඳහා වූ විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රයේ විෂය නිර්දේශය (විෂය අංකය 04)

01. * ශ්‍රී ලංකාවේ පශු සම්පත් ක්ෂේත්‍රය එහි ගති ලක්ෂණ හා විශේෂිත අංගයන් සහ එම ක්ෂේත්‍රයේ සංවර්ධන අවශ්‍යතා, සංවර්ධන හැකියාවන් සහ අභියෝග
 * පශු සම්පත් නිෂ්පාදනය, සැකසීම හා අලෙවිය වෙනුවෙන් එම ක්ෂේත්‍රය තුළ රාජ්‍ය, පෞද්ගලික සහ රාජ්‍ය නොවන ආයතනික ව්‍යුහයන් සංවිධානය වී ඇති ආකාරය
02. ග්‍රාමීය සහ ජාතික ආර්ථික සංවර්ධනය කෙරෙහි පශු සම්පත් ක්ෂේත්‍රයේ වැදගත්කම සහ එහි ඇති සබැඳියාව
03. ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල ඇති සම්පත් ප්‍රශස්ත ලෙස යොදා ගැනීම් වස් විවිධ සත්ත්ව විශේෂයන් සඳහා යොදාගත හැකි අභිජනන උපාය මාර්ගයන්
04. සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන සත්ත්ව ආහාර ප්‍රභවයන්, සුලභතාව හා ඒවා අනාගත අවශ්‍යතාවන් සඳහා වැඩි දියුණු කිරීමේ උපාය මාර්ගයන්, පශු සම්පත් සඳහා පෝෂණ අවශ්‍යතාවයන් සහ එම සත්ත්ව විශේෂයන් සඳහා ආහාර සලාක සකස් කිරීම
05. සත්ත්ව පාලනය, කෘෂිකර්මය, මත්ස්‍ය විද්‍යාව, වනජීවී, පරිසර සහ මහජන පශු වෛද්‍ය සේවාව සඳහා වැදගත්වන අණපනත්, නීති, රෙගුලාසි සහ ඒවායේ පරමාර්ථ සහ වැදගත්කම
06. විවිධ ගොවි නිෂ්පාදන පද්ධති සහ පශු සම්පත් නිෂ්පාදනය, ගොවිපල් සැලසුම් කිරීම සහ ගොවිපල් අයවැය සැකසීම, ගොවිපල් වාර්තා තබා ගැනීම සහ කෘෂි භෝග සහ පශු සම්පත් අතර පවතින අන්‍යෝන්‍ය සම්බන්ධතාව තුළින් ඵලදායීතාව නැංවීම
07. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ආර්ථික සංවර්ධනය සඳහා තාක්ෂණ දැනුම ලබා දීම සඳහා කෘෂි/සත්ත්ව පාලන ව්‍යාප්ත සේවාවල ඇති වැදගත්කම, එම කාර්යයන් සඳහා උචිත ව්‍යාප්ත සේවා උපාය මාර්ග සහ ක්‍රමවේදයන්
08. ගෝලීයකරණය, තොරතුරු සහ සංනිවේදන තාක්ෂණය සහ ශ්‍රී ලංකාවේ පශු සම්පත් ක්ෂේත්‍රයට එහි ඇති බලපෑම
09. පශු සම්පත් ක්ෂේත්‍රය කෙරෙහි ජාත්‍යන්තර වෙළඳාම, වෙළඳ ගනුදෙනු සහ ඒවායේ වැදගත්කම සහ බලපෑම
10. සත්ත්ව නිරෝධායන ක්‍රම වේදයන්, ආනයන හා අපනයන කාර්යයන් කෙරෙහි සතුන් හා සත්ත්ව නිෂ්පාදන සම්බන්ධව සත්ත්ව නිරෝධායන පිළිවෙත්හි ඇති වැදගත්කම

විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ. සුදුසුකම් තිබේ නම් තනතුරු දෙකටම අදාළ විභාග සඳහා පෙනී සිටිය හැක.

05-196

**රාජ්‍ය සේවයේ කණිෂ්ඨ සේවකයින් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන පන්තියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගය - 2009**

1.0 රාජ්‍ය සේවයේ කණිෂ්ඨ සේවකයින් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන පන්තියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2010 අගෝස්තු මස පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 මධ්‍යම රාජ්‍ය සේවයට අයත් කණිෂ්ඨ සේවකයින් සඳහා මෙම විභාගය පහත සඳහන් නගරවලදී පැවැත්වේ. එම නගර සහ නගරවලට අදාළ නගර අංක පහතින් දැක්වේ. ප්‍රමාණවත් අපේක්ෂකයින් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවීම හෝ වෙනත් හේතූන් මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයක් අවලංගු කර අපේක්ෂකයින්ගේ දෙවන මනාපය පරිදි මධ්‍යස්ථානය තීරණය කිරීමේ අභිමතය විභාග කොමසාරිස් ජනරාල් සතුවේ.

| *නගරය* | *නගර අංකය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|---|
| කොළඹ | 01 | ත්‍රිකුණාමලය | 14 |
| ගම්පහ | 02 | මඩකලපුව | 15 |
| කළුතර | 03 | අම්පාර | 16 |
| මාතලේ | 04 | පුත්තලම | 17 |
| මහනුවර | 05 | කුරුණෑගල | 18 |
| නුවරඑළිය | 06 | අනුරාධපුරය | 19 |
| ගාල්ල | 07 | පොළොන්නරුව | 20 |
| මාතර | 08 | බදුල්ල | 21 |
| හම්බන්තොට | 09 | මොණරාගල | 22 |
| යාපනය | 10 | කෑගල්ල | 23 |
| මන්නාරම | 11 | රත්නපුර | 24 |
| මුලතිව් | 12 | කිලිනොච්චිය | 25 |
| වව්නියාව | 13 | | |

3.0 (i) මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

(ii) විභාග අපේක්ෂකයින් සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

4.0 *අයදුම්කරුවන් මෙම විභාගයට පෙනී සිටිය යුතු භාෂා මාධ්‍ය* : මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අපේක්ෂකයින්ට සිය මනාපය පරිදි මින් එක් භාෂා මාධ්‍යයකින් පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැකි අතර ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

5.0 *වැටුප* .- අංක 06/2006 (IV) හා 2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III, II හා I වන පන්තිවලට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 13,990, 10 x 145, 11 x 170, 6 x 240, 14 x 320, රු.23,230 වේ. රු. 15,440 න් ඔබ්බට යාම සඳහා II වන පන්තියට උසස්වීම ද රු. 17,310 න් ඔබ්බට යාම සඳහා i වන පන්තියට උසස් වීම ද ලබාගත යුතුය.

*සටහන*.- පත්වීම ලබන අවධියේ ක්‍රියාවේ යෙදෙන වැටුප් වැඩිවීමේ නීතිරීතිවලට යටත්ව, වැටුප් වැඩිවීම් වාසි ලබාදෙනු ලැබේ.

6.0 සේවා කොන්දේසි :

(i) මෙම විභාගයෙන් සාමාර්ථ්‍යය ලබන අයදුම්කරුවන්ට පත්වීමේ දින සිට එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත්ව පත්වීම් දෙනු ලැබේ. ඔවුන්ගේ තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවෙහි සඳහන් අවශ්‍යතාවන් සම්පූර්ණ කළ පසු සේවයෙහි ස්ථිර කිරීම සිදු කරනු ලැබේ.

(ii) මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත් කරන ලද අයදුම්කරුවන් ස්ථාන මාරු කිරීමටත්, ලංකාවේ ඕනෑම තැනකට පත් කිරීමටත් යටත් වේ.

(iii) පත්වීම ලැබ වසර 05ක් ගතවීමට පෙර 2007.05.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 පරිදි දෙවන රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් ලබා ගත යුතුය.

7.0 *පත්වීම සඳහා තෝරාගනු ලබන අන්දම*.- මධ්‍යම රජයේ පුරප්පාඩු සඳහා මධ්‍යම රාජ්‍ය සේවයේ යෙදෙන කණිෂ්ඨ සේවක සේවිකාවන් පමණක් තරග විභාගයට ඇතුළත් කරනු ලැබේ. විභාගයට අදාළ එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු සියයට හතළිහක් (40%) හෝ ඊට වැඩියෙන් ලබා ගන්නා අයදුම්කරුවන් තෝරා, ඔවුන්ගේ එම ලකුණුවල එකතුවට අනුව කුසලතා පදනම මත තෝරාගනු ලැබේ.

8.0 *යෝග්‍යතාව*.-මෙම විභාගය සඳහා තරග කිරීමට සුදුසුකම් ලැබීම පිණිස සෑම අපේක්ෂක අපේක්ෂිකාවක්ම ;

(i) 2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 (iv) අනුව පීඑල්-1-2006 ඒ, පීඑල් -2-2006 ඒ, සහ පීඑල්-3-2006ඒ, වැටුප් කේත අංක යටතේ වන වැටුප් පරිමාණයක් සහිත ස්ථිර පත්වීම් දරන මධ්‍යම රාජ්‍ය සේවයේ කණිෂ්ඨ සේවකයකු විය යුතු අතර, එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය. (ආයතන සංග්‍රහයේ I වැනි පරිච්ඡේදයේ දැක්වෙන අර්ථ නිරූපණයකට ඇතුළත් රජයේ සේවකයකු/සේවිකාවක විය යුතුය.)

(ii) 2009.12.31 දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05ක අඛණ්ඩ සක්‍රීය සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.

(iii) 2001.11.26 වැනි දිනට පසුව සේවයේ ස්ථිර කර ඇති අපේක්ෂකයන් භාෂාව/සාහිත්‍යය හා අංක ගණිතය/ශුද්ධ ගණිතය/මූලික ගණිතය/වාණිජ අංක ගණිතය ඇතුළුව විෂයයන් හයක් (06) ඇතිව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගයෙන් සමත්ව සිටිය යුතුය.

*සටහන* :

1. යම් තනතුරකට ස්ථිරව පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇත්තාවූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්තාවූ හෝ පුහුණු වීමේ කාල පරිච්ඡේදයක් ඉහත (ii) හි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ. යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික/අනියම් සේවා කාල පරිච්ඡේද ඉහත (ii) හි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ.

2. රජයේ සේවයේ සියලුම මෝටර් රථ රියදුරන්ට, සෙසු සුදුසුකම් තිබේ නම් තම වැටුප් ක්‍රමය කවරක් වුව ද ඒ ගැන නොතකා මෙම තරග විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු ලැබේ.

3. ඉහත (ii) හි සඳහන් අවුරුදු 05ක සතුටුදායක සේවය පහත සඳහන් පදනම මත තීරණය කරනු ලැබේ. පහත සඳහන් අවශ්‍යතාවන් සම්පූර්ණ කර ඇති අය මෙම විභාගයේ කාර්යයන් සඳහා සතුටුදායක සේවයක් ඇති අයදුම්කරුවන්/අයදුම්කාරියන් සේ සළකනු ලැබේ.

(*අ*) 2009.12.31 වැනි දිනට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුළදී ලැබෙන සියලුම වැටුප් වර්ධක ලබා තිබීම.
(*ආ*) 2009.12.31 වැනි දිනට පෙර වර්ෂ 05ක් තුළදී කිසිදු විනයානුකූල දඬුවමකට යටත් කර නොතිබීම.

4. පත්වීම සඳහා අයදුම්කරු/අයදුම්කාරිය තෝරා ගනු ලැබී නම් ඔහු/ඇය මුදා හැරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා කැමති විය යුතුය.

5. අර්ධ කාර්මික කාර්යයන්හි නියුක්තව සිටින්නා වූ හෝ යම් කාර්යයක් සඳහා පුහුණු කර ඇත්තාවූ හෝ රජය විසින් විශේෂ පුහුණුවක් ලබා දී ඇත්තාවූ කවර හෝ ශ්‍රේණියක සේවකයින් මෙම විභාගයට පෙනී සිටීමට සුදුස්සන් නොවනු ඇත. නිදර්ශන වශයෙන් ඉංජිනේරු හා කර්මාන්තශාලා ශ්‍රේණිවල සේවකයින් හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය සේවිකාවන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු නොවනු ඇත. යම් සේවකයකු සුදුසු ද නුසුදුසු ද යන කරුණු පිළිබඳව යම් සැකයක් පහළ වූ විට දී ඒ සම්බන්ධයෙන් අයදුම්කරු/අයදුම්කාරිය, ඔහුගේ/ඇයගේ දෙපාර්තමේන්තුවෙන් විමසිය යුතු අතර එම දෙපාර්තමේන්තුව රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ඒ සම්බන්ධව විමසිය යුතුය.

මෙම විභාගයට පෙනී සිටීම සඳහා යම් සේවකයෙකුගේ යෝග්‍යතාව සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් විමසීමේදී වැටුප් පරිමාණය සහිතව සේවකයාගේ කාර්යයන් පිළිබඳව පූර්ව විස්තරයක් අදාළ දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ යුතු අතර, එම කාර්යය

දැරීම සඳහා අවශ්‍යතාව සපුරා ගැනීමට පුහුණුවක් අයදුම්කරුට/අයදුම්කාරියට ලබාදී ඇත්ද යන වග හා එවැනි පුහුණුවක් වෙතොත් එම පුහුණුවේ ස්වභාවය හා කාලසීමාව ද සඳහන් කළ යුතුය.

6. රාජ්‍ය සේවයේ තාවකාලික හා අනියම් සේවකයින්, මණ්ඩල සංස්ථා හා එවැනි අංශවල සේවකයින් මෙම විභාගයේ දී තරග කිරීමට සුදුස්සන් නොවනු ඇත.

7. තැපැල් දෙපාර්තමේන්තුවට අයත් ඒකාබද්ධ සේවයේ කණිෂ්ඨ සේවකයින්ට හැර එම දෙපාර්තමේන්තුවේ වෙනත් කිසිම කණිෂ්ඨ සේවකයකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නැත.

8. මෙහි නියමිත සුදුසුකම් තමන් විසින් සපුරා ඇති බවට අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර අයදුම්කරුවන්/අයදුම්කාරියන් සෑහීමකට පත්විය යුතුය. මෙම නිවේදනයේ දැක්වෙන සුදුසුකම් නොමැතිව විභාගයට ඉදිරිපත්වන අයදුම්කරුවන්/අයදුම්කාරියන් විභාගයේ දී ප්‍රමාණවත් ලකුණු මට්ටමක් ලැබුව ද පත්වීම් ලැබීමට නුසුදුස්සෝ වෙති.

9.0 අයදුම්පත් :

(i) මෙම විභාගයට ඇතුළත්වීමේ ආදර්ශ අයදුම්පතක් මෙම නිවේදනයට යාකර ඇත. අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක ආරම්භයේ සිට 4.0 තෙක් පළමුවන පිටුවටද ඉතිරිය දෙවන පිටුවටද වන ලෙස ගෙන සකස් කළ යුතු අතර අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

(ii) විභාග ගාස්තු.- විභාග ගාස්තුව රු. 250කි. මෙම මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ 2003..20.13 ආදායම් ශීර්ෂය යටතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට හෝ ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන ලදුපත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැළවෙන සේ ඇලවිය යුතුය. (ලදුපතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

(iii) අයදුම්පත නිවැරදිව ද පැහැදිලිව ද අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්අකුරින්ම සම්පූර්ණ කොට 2010.06.14 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් මාර්ගයෙන් ලියාපදිංචි කළ තැපැලෙන් යැවිය යුතුය.

(iv) අයදුම්පත මේ සමග ඇති ආකෘතිය පරිදිම සකස් කරගත යුතු වන අතර, එක් අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කළයුත්තේ එක් අයදුම්පතක් පමණක් බවද අයදුම්පතේ ඡායා පිටපත් හෝ ප්‍රගමන පිටපත් නොඑවන මෙන් ද දන්වා සිටිනු ලැබේ. අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදිය යුතුය.

10.0 අයදුම්පතේ අගට යොදා ඇති අත්දමේ සහතිකයක් දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ලබා දිය යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රය බහා එවන ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම පැහැදිළිව ලිවිය යුතුය. යම් අයදුම්කරුවකු/අයදුම්කාරියක මෙම ක්‍රියාපිළිවෙත අනුගමනය කිරීමට අපොහොසත් වුවහොත් ඔහුගේ/ඇයගේ අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය. 2010.06.14 වැනි දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කිරීම සඳහා ස්වකීය අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත කල් ඇතුව ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්/අයදුම්කාරියන් වෙත දන්වා සිටිනු ලැබේ.

11.0 අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරින් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාල සටහනේ පිටපතක් සමඟ විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. ඒ හා සමඟම ඒ බැව් සඳහන් පුවත්පත් නිවේදනයක් දිනමිණ, තිනකරන්, හා ඩේලිනිව්ස් යන පුවත්පත්වල පළවනු ඇත. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. නිවේදනය පළවී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායි වනු ඇත.

12.0 විභාගයට ඇතුළත් කර ගැනීම, ඊට යෝග්‍යතාව පිළිගැනීමක් නොවේ. එසේ ඇතුළත් කර ගැනීම පසු අවස්ථාවක දී පිරික්සා බැලීමට යටත් වන්නකි. විභාගයේ දී තරග කිරීමට නුසුදුස්සකු බව පසු අවස්ථාවක දී අනාවරණය වූ අයදුම්කරුවකුගේ/අයදුම්කාරියකගේ අපේක්ෂකත්වය විභාගයට පෙර, විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයට පසු කවර අවස්ථාවක දී වුවද අවලංගු කරනු ලැබිය හැකිය.

13.0 විභාග ප්‍රතිඵල විභාග කොමසාරිස් ජනරාල් විසින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරනු ඇත.

14.0 *අයදුම්කරුවන්ගේ අනන්‍යතාව* - අයදුම්කරුවන් විභාග ශාලාව තුළදී පෙනි සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

15.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරී නිවාඩු ලබාදිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

16.0 *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්.*- ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

17.0 විභාග පරිපාටිය :

විභාග විෂය හා ඒ ඒ විෂයයට වෙන් කරන ලද ලකුණු පහත දැක්වේ:

| | විෂය | ලකුණු | කාලය |
|---|---|---|---|
| (i) | සාමාන්‍ය දැනීම | 100 යි | පැය 2යි |
| (ii) | අභියෝග්‍යතා පරීක්ෂණය | 100 යි | පැය 1 යි |
| | එකතුව | 200 යි | |

සාමාන්‍ය දැනුම : (කාලය පැය 02යි)

(i) සාමාජීය, සංස්කෘතික, දේශපාලන හා විද්‍යාත්මක කරුණු පිළිබඳව දැනුම මැනීම.
(ii) දේශීය හා විදේශීය කාලීන සිදුවීම් පිළිබඳ දැනුම මැනීම
(iii) රජයේ කාර්යාලයක භාවිතා වන සරල කාර්යාල ක්‍රම සහ ඇමතුම් දින පොත, විෂය ගොනු ලේඛනය, වවුචර්, චලන පත්‍රිකා, පැමිණීමේ ලේඛනය, දින මුද්‍රාව, මුද්‍රාව හා නාම මුද්‍රාව, තැපැල් මල්ල ආදී කාර්යාල උපකරණ හා ඒවා මැනවින් භාවිතා කිරීම පිළිබඳව අපේක්ෂකයාගේ සාමාන්‍ය දැනුම හා අවබෝධය මැනීම.
(iv) රාජ්‍ය ආයතනවල පවත්වාගෙන යන යහපත් සන්නිවේදන ක්‍රම, මනා ලෙස කාර්යාලය හා අවට පරිසරය පවත්වාගෙන යාම, යහපත් ලෙස මහජන සබඳතා පවත්වාගෙන යාම ආදී කරුණු පිළිබඳව අපේක්ෂකයාගේ අවබෝධය හා ආකල්ප මැනීම.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ.

i වන කොටස - කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න 40 යි (විනාඩි 40 යි ලකුණු 40 යි)

ii වන කොටස - සිද්ධියක්, ප්‍රකාශයක් හෝ ඡේදයක් ඇසුරෙන් අසනු ලබන කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න 10ක් සහ අර්ධ ව්‍යුහගත ප්‍රශ්න 4න් 3ක් (විනාඩි 80යි - ලකුණු 60යි)

අභියෝග්‍යතා පරීක්ෂණය (කාලය පැය 01යි)

(i) සංඛ්‍යා, සරල ගණිත ගැටලු විසඳීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්ථාර/වගු සැකසීම.
(ii) සාමාන්‍ය බුද්ධිය හා තර්කන හැකියාව මැනීමේ ප්‍රශ්න.
(iii) අපේක්ෂකයාගේ අදහස් ප්‍රකාශන හැකියාවන්, අවබෝධ කර ගැනීමේ හැකියාව, වාක්‍ය කීපයක අදහස තනි වාක්‍යයකින් ලිවීම, අක්ෂර වින්‍යාසය හා විරාම ලකුණු භාවිතය පරීක්ෂා කිරීම, නිවැරදි ව්‍යාකරණ භාවිතය හා පද පිළිබඳව දැනුම.
(iv) දී ඇති තොරතුරු අනුව සරල ලිපියක් කෙටුම්පත් කිරීම, සටහනක් ලිවීම, කෙටි වාර්තාවක් ලිවීම, ආරාධනා පතක් පිලියෙල කිරීම, න්‍යාය පත්‍රයක් සැකසීම පිළිබඳව දැනුම.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ.

i කොටස - බහුවරණ ප්‍රශ්න 20 යි - (ලකුණු 20 යි - විනාඩි 15 යි)
ii කොටස - රචනාමය ප්‍රශ්න 03 යි - (ලකුණු 80 යි - විනාඩි 45 යි)

සටහන : (i) සේවයේ රාජකාරි සඳහා අපේක්ෂකයකුගේ යෝග්‍යතාව හා හැකියාව පරීක්ෂා කර බැලීමට මෙම ප්‍රශ්න පත්‍ර සකස් වී ඇත.

(ii) සෑම ලිඛිත උත්තර පත්‍රයක ම නොපැහැදිලි අත් අකුරු සහ අක්ෂර වින්‍යාස දෝෂ වෙනුවෙන් ලකුණු අඩු කරනු ලැබේ.

18.0 මෙම විභාග නිවේදනයට විධිවිධාන සළසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

බී. පී. පී. එස්. අබේගුණරත්න,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2010 අප්‍රේල් මස 27 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

ආදර්ශ අයදුම් පත්‍රය

| |
|---|
| |

(කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණයි)

රාජ්‍ය සේවයේ කණිෂ්ඨ සේවකයින් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන පන්තියට උසස් කිරීමේ සීමිත තරග විභාගය - 2009
Limited Competitive Examination for promotion of Minor Employees of the Public Service to Class III of The Public Management Assistants' Service - 2009

| නගරය | නගර අංකය |
|---|---|
| 1. | |
| 2. | |

(ගැසට් නිවේදනය අනුව ඔබ විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය සඳහන් කරන්න) (මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

ඔබ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
(මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ)

1.0 1.1 අයදුම්කරුගේ මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා. : SILVA, A. B.
1.2 සම්පූර්ණ නම :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
1.3 සම්පූර්ණ නම :———.
(සිංහලෙන්/දෙමළෙන්)

2.0 සේවා ස්ථානය හා ලිපිනය :———.
2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :———.
2.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :———.
2.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී -1
පුරුෂ - 0
(අදාල අංකය කොටුව තුළ ලියන්න.)

3.2 උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

3.3 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

4.0 සේවා විස්තරය :

4.1 ඔබ දැනට සේවය කරන දෙපාර්තමේන්තුවේ නම :———.
4.2 දැනට දරන තනතුරේ පදවි නාමය :————.
4.3 දැනට දරන තනතුරට පත්වූ දිනය :————.
4.4 දැනට දරන තනතුර ස්ථිර ද නැතහොත් තාවකාලික ද යන වග :————.
4.5 දැනට දරන තනතුරෙහි සේවය ස්ථිර කර තිබේද යන වග :———.
4.6 සේවය ස්ථිර කර තිබේ නම් ස්ථිර කිරීම සඳහා යෝග්‍යතා ලැබූ දිනය :————.
4.7 දැනට දරන තනතුරේ සේවය ස්ථිර කරමින් නිකුත් කරන ලද ලිපියේ යොමු අංකය හා දිනය :————.
4.8 දැනට ලබන වාර්ෂික වැටුප (ඒකාබද්ධ) :————.
4.9 දැනට දරන පත්වීම විශ්‍රාම වැටුප් සහිත ද යන වග :———.

5.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
(ii) ලදුපත් අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. |
|---|

මා විසින් මෙහි සඳහන් කර ඇති තොරතුරු නිරවද්‍ය බව සහතික කරමි. මෙහි සඳහන් කවර හෝ තොරතුරක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත්, මා නුසුදුස්සකු කිරීමටත්, පත් කර ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමටත් හැකි බව මම දනිමි. තවද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන
(දෙපාර්තමේන්තු ප්‍රධානියා ඉදිරිපිට දී)

දිනය :————.

සටහන.- තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලයලත් නිලධාරියකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

**අත්සන සහතික කිරීම**

මාගේ කාර්යාලයේ නිලධාරියකු/නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ........................... මහතා/මහත්මිය මෙනෙවිය ............... වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන සහ
නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

1. මෙම අයදුම්කරු/අයදුම්කාරිය වන .............................. මහතා/මහත්මිය/මෙනෙවිය මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත අයකු බව ද,
2. ඔහු/ඇය ස්ථිර තනතුරක් දරමින් සිටින බව ද,
3. ඔහු/ඇය ස්ථිර තනතුරක 2009.12.31 දින වන විට සේවයේ ස්ථිර කරනු ලැබ සිටින බව ද,
4. ස්ථිර තනතුරක සේවයේ ස්ථිර කරමින් ලිපියක් ඔහුට/ඇයට නිකුත් කර ඇති බව ද,
5. ඔහු/ඇය 2009.12.31 වැනි දිනට හෝ ඊට පෙර යටත් පිරිසෙයින් අවුරුදු 05ක අඛණ්ඩ සේවය සම්පූර්ණ කර ඇති බවද,
6. ඔහු/ඇය මෙම ගැසට් නිවේදනයේ 8.0 වැනි ඡේදයේ නියමිත සීමාවන් ඇතුළත ඇති වැටුප් ලබමින් හෝ වැටුප් ක්‍රමයක සිටින බව ද,
7. ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම 2009.12.31 වැනි දිනට පූර්වාසන්න අවුරුදු 05 ඇතුළත සතුටුදායකව පැවැති බවද,
8. මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කරනු ලබන බවද,
9. රුපියල් 250ක් වටිනා ලදුපතක් අයදුම්පත්‍රයේ අලවා ඇති බවද,
10. ඔහුගේ/ඇයගේ අයදුම්පතෙහි දැක්වෙන විස්තර මෙම දෙපාර්තමේන්තුවේ ඇති ලේඛන සමඟ හරිවැරදි බලා ඇති බව සහ මෙම විභාගයට අදාළ විභාග නිවේදනයේ දැක්වෙන රෙගුලාසි අනුව මෙම විභාගයට පෙනී සිටීමට ඔහු/ඇය සුදුසු බව ද, මම සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

සංලක්‍ෂය :

(1) දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් අත්සන් කිරීමට නිසි ආකාර බලතල පවරනු ලැබූ මාණ්ඩලික නිලධාරියකු හෝ විසින් පමණක් මෙම සහතිකය අත්සන් කළ යුතුය. සහතිකයේ අඩංගු කරුණු සෑම අයුරකින්ම නිවැරදි බවට සහතිකය නිකුත් කරන නිලධාරියා සෑහීමකට පත්විය යුතුය.

(2) යෝග්‍යතාව පිළිබඳව සියලුම අවශ්‍යතාවන් සම්පූර්ණ නොකරන අයදුම්කරුවන් වෙතොත් ඔවුන්ගේ අයදුම්පත් විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් නොකළ යුතුය.

05-316

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.